# බාජින්ගේ 'පවුල' නවකතාවෙන් නිරූපිත මධ්‍යකාලීන චීන සමාජයේ අධ්‍යාපන සංස්ථාව

*ජයනි සමීරා, එම්. ඒ. ජී.* [1]

මේ පර්යේෂණයේ අරමුණ වන්නේ බාජින් විසින් විරචිත 'පවුල' නවකතාවෙන් හෙළිවන තතු ඔස්සේ මධ්‍යකාලීන චීන සමාජයේ සංස්ථාපනය වී පැවැති අධ්‍යාපන සංස්ථාව හඳුනා ගැනීමයි. මෙහිදී නවකතාවකින් සමකාලීන සමාජීය තතු තත්ත්වාකාරයෙන් හෙළිදරව් කර ගත හැකිදැයි යන ගැටලුව කේන්ද්‍ර කොටගෙන මෙම පර්යේෂණ පත්‍රිකාව සැකසේ. ඒ අනුව 'පවුල' නවකතාවෙන් සමකාලීන චීන අධ්‍යාපන ක්‍රමය ගවේෂණය කිරීම අපේක්ෂා කෙරේ. බාජින් සිය අත්දැකීම් පාදක කොටගෙන මෙම නවකතාව රචනා කළ බව පෙරවදනෙහි ආත්ම කථනයක් වශයෙන් සඳහන් කර තිබීමෙන් එහි අන්තර්ගත තොරතුරු විශ්වාස කිරීමේ ශක්‍යතාවක් පවතී. වර්ෂ 1931දී ප්‍රථම වරට 'පවුල' නවකතාව පළ වී ඇත. මධ්‍ය කාලයට අයත් 19වන සියවසේ සමාජ තත්ත්වය විග්‍රහ කරමින් බාජින් 'පවුල' නවකතාව රචනා කිරීමේදී සමකාලීන චීන සමාජයේ අධ්‍යාපන පටිපාටිය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට ඇති බව පෙනෙයි. ඒ අනුව තත් අවධියේ ගැහැනු ළමුන්ට හා පිරිමි ළමුන්ට අධ්‍යාපනය හැදෑරීමේදී පැවති සීමාසහිත නිදහස, සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයේ හා පාසල් අධ්‍යාපන ක්‍රමයේ වෙනස, හැදෑරීමට නිර්දිෂ්ට වූ විෂයයන් හා පාසල් ශිෂ්‍යයන්ට රජයෙන් එල්ල වුණු බලපෑම් පිළිබඳව පැහැදිලිව හඳුනාගත හැකි විය. මේ සම්බන්ධයෙන් පර්යේෂණ පවත්වා ඇති චීන ජාතික පර්යේෂකයින් අන්තර්ජාලයට එකතු කර ඇති තොරතුරු ඇසුරින් බාජින්ගේ 'පවුල' නවකතාවෙන් නිරූපිත කරුණු සාධනය කර ගැනීමට අවකාශ උදාවිය.

19වන සියවසේ ප්‍රථම භාගය වන තෙක් චීන සමාජයේ ව්‍යාප්තව පැවතියේ සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවක් බවත්, පිතෘමූලික සමාජය තුළදී දරුවන්ගේ පාසල් අධ්‍යාපනයේ නිදහස තරමක් ඇහිරී තිබුණු බවත්, විශේෂයෙන් ගැහැනු ළමුන් සම්බන්ධයෙන් වූ තත්ත්වය පිරිමි ළමුන්ට සාපේක්ෂව සුබදායක නොවුණු බවත්, පාසල් අධ්‍යාපනයෙන් බුද්ධියේ නිම්වළලු පුළුල් කර ගන්නා ශිෂ්‍යයා සාම්ප්‍රදායික සමාජ ක්‍රමය අභිබවමින් නව සමාජ ක්‍රමයක් උදාකර ගැනීමට කටයුතු කළ බවත් හා මෙම තත්ත්වය යටතේ පාසල් සිසුන්ට රජයෙන් නිතර

බලපෑම් එල්ල වූ බවත් අනාවරණය කර ගත හැකි විය. 19වන සියවසේ මධ්‍ය භාගයෙන් පසු උදාවන චීනයේ අධ්‍යාපන ක්‍රමවේදය, පැවති සියලු තත්ත්වයන් අභිබවමින් නව මුහුණුවරක් ගන්නා බව මෙම පර්යේෂණයේදී විශේෂයෙන් හඳුනා ගැනීමට හැකි විය. 20වන සියවස ආරම්භයත් සමග චීන අධ්‍යාපන ක්‍රමවේදය පුළුල් වීම හා වර්ධනය වීම කෙරෙහි 19වන සියවසේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවූ තද් විපර්යාසය ඉවහල් වී ඇති බව නිගමනය කළ හැකිය. සාහිත්‍ය කෘතියකින් යම්තාක් දුරකට සමාජ ප්‍රතිබිම්බන කාර්යයක් ඉටු කරන බව බාජින්ගේ '**පවුල**' නවකතාවෙන් තහවුරු කරගත හැකි විය.

**ප්‍රමුඛ පද :** 'පවුල' නවකතාව, මධ්‍යකාලීන චීන සමාජය, සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය, පාසල් අධ්‍යාපන ක්‍රමය, සමාජ ප්‍රතිබිම්බන කාර්යය

[1]*සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. jayanisameera7@gmail.com*